Department of Education Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය-ව්‍යාපාර අධ්‍යයනය

සතිය- 3

ශ්‍රේණිය-13

සකස් කළේ - රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

නිපුණතා මට්ටම 16.6 - ආකර්ශනය කර ගත් අයදුම්කරුවන් අතරින් සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා යෝග්‍ය ක්‍රම යෝජනා කරයි.

# තෝරා ගැනීම

ආකර්ෂණය සහ තෝරාගැනීම ආයතනයකට වැදගත් වන්නේ අදාළ රැකියා සඳහා නිවැරදි පුද්ගලයින් තෝරා ගැනීමට අපොහොසත් වුව හොත් අනාගතයේදී ගැටළුකාරී තත්ත්වයන්ට ආයතනයක් වශයෙන් මුහුණ දීමට සිදුවන බැවිනි.නිවැරදි තෝරා ගැනීමේ ක්‍රමයක් හරහා පහත අරමුණු ඉටු කර ගැනීමට කළමනාකාරීත්වයට හැකියාව ලැබේ.

1.අදාළ රැකියාවට යෝග්‍යතම පුද්ගලයා සේවයේ පිහිටුවිය හැකිවීම.

2.තෝරා ගැනීමේ පිරිවැය අඩු කරලීම.

3.යහපත් සේව්‍ය සේවක සබඳතාවක් ගොඩ නැගිය හැකිවීම.

<u>පුද්ගලයෙකු රැකියාවකට තෝරා ගැනීමේ විවිධ ක්‍රම</u>

1.ඉල්ලුම්පත් ඇගයීම/ජීව දත්ත ඇගයීම

2.සම්මුඛ පරීක්ෂණ

3.විවිධ පරීක්ෂණ මගින් (කුසලතා පරීක්ෂණ,ප්‍රායෝගික පරීක්ෂණ,දැනුම් පරීක්ෂණ ආදී)

4.පසුතල ගවේෂණය මගින්(ඉගෙනුම සහ පුහුණුව ලත් ආයතන මගින් පුද්ගලයා පිළිබඳව විමසීම.

5.අධ්‍යාපන හා වෘත්තීය ආයතනවල සහය ලබා ගනිමින් තෝරා ගැනීම.

සංවිධානයක පුරප්පාඩු වූ රැකියාවක් සඳහා සුදුසුතම අයදුම්කරු තෝරා ගැනීම හරහා ආයතනයකට ලබා ගත හැකි ප්‍රතිලාභ අතිමහත්ය.සේවක පිරිවැටුම අවම වීම,සේවක රැකියා තෘප්තිය ඉහළ යාම,පිරිවැය අවම වීම ප්‍රධාන වේ.එමෙන්ම ස්ථාපිත අරමුණු කරා බාධාවකින් තොරව ළඟාවීමටද ඉන් ලැබෙන්නේ ඉමහත් පිටිවහලකි.

<u>ඇගයීම</u>

ආයතනයනට රැකියා සඳහා අවශ්‍ය පුද්ගලයින් නිවැරදිව තෝරා නොගැනීම නිසා ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල විමසීමට ලක් කරන්න.